REFERENCE ONLY

R/C

2016 . 07 . 20

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# කතෝලික ධර්මය I , II

විභාග අංකය: ..................................................... | කාලය පැය 03 යි.

10 ශ්‍රේණිය | I කොටස

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරන්න.
- සපයා ඇති පිළිතුරු පත්‍රයේ ඔබ තෝරා ගත් පිළිතුරේ අංකය මත 'X' ලකුණ යොදන්න.

01. ලූක්තුමා විසින් රචනා කරන ලද දෙවන සුවිශේෂය වනුයේ,
(1) නික්මයාම පොත ය . (2) උත්පත්ති පොත ය.
(3) ක්‍රියා පොත ය. (4) ද්විතියික නීති සංග්‍රහය පොත ය.

02. පංච පුස්තකය හඳුන්වන වෙනත් නමක් වනුයේ,
(1) ඉතිහාස පොත් ය. (2) දිවැසි පොත් ය.
(3) ප්‍රඥා පොත් ය. (4) මොසස්ගේ නීතිය ය.

03. බයිබලයේ නව ගිවිසුම තුළ වැඩි ම සංදේශ ගණනක් ලියා ඇත්තේ,
(1) පේදුරුතුමා ය. (2) ලූක්තුමා ය.
(3) ජාකොබ්තුමා ය. (4) පාවුළුතුමා ය.

04. එළිදරව් සාහිත්‍ය තුළ ක්‍රිස්තුන් වහන්සේව සංකේතවත් කර ඇත්තේ,
(1) කොටළුවා ලෙස ය. (2) පරවියා ලෙස ය.
(3) බැටළුවා ලෙස ය. (4) මකරා ලෙස ය.

05. ගලීල ප්‍රදේශයේ ආණ්ඩුකාරයා (පාලකයා) වූයේ........
(1) ආකිලෙවුස් ය. (2) හෙරෝද් ඇන්ටිපස් ය.
(3) පිලාත්තු ය. (4) පෝන්සියෝ ය.

06. පෙන්තකෝස්ත දිනයේ විශේෂ සිදුවීම වනුයේ,
(1) ශුද්ධ වූ සභාවේ ආරම්භයයි. (2) ස්වර්ගාරෝහණයයි.
(3) මළවුන්ගෙන් උත්ථාන වීමයි. (4) එම්මාවුස් ගමනයි.

07. සංකේත මගින් විවිධ පණිවිඩ ඉදිරිපත් කර ඇත්තේ,
(1) එළිදරව් සාහිත්‍යයෙහි ය. (2) නික්මයාම පොතෙහි ය.
(3) පාවුළුතුමාගේ සංදේශවල ය. (4) ක්‍රියා පොතෙහි ය.

08. එපීස හා කොලොස්සි සංදේශ දෙක අයත් වනුයේ,
(1) පාවුළුතුමා විසින්ම ලියන ලද සංදේශ (2) ද්විතියීය පාවුළු සංදේශ
(3) ආරුඪ කර්තෘත්වයයි (4) වෙනත් සංදේශ

09. ස්වර්ගාරෝහණ මංගල්‍ය සිදුවූයේ,

(1) ජේසුස් වහන්සේ උත්ථාන වී දින 50 කට පසුව ය.
(2) ජේසුස් වහන්සේ උත්ථාන වී දින 30 කට පසුව ය.
(3) ජේසුස් වහන්සේ උත්ථාන වී දින 40 කට පසුව ය.
(4) ජේසුස් වහන්සේ උත්ථාන වී දින 35 කට පසුව ය.

10. "හෙක්මා" යන හෙබ්‍රෙව් වචනය යොදා ඇත්තේ කුමන අර්ථයකින් ද?

(1) සාහිත්‍ය (2) බයිබලය
(3) ග්‍රන්ථ (4) ප්‍රඥාව

11. ජාකෝබ්තුමා කුමන මන්ත්‍රණ සභාවේ මූලිකත්වය ගන්නේ ද?

(1) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව ය. (2) දෙවන වතිකානු මන්ත්‍රණ සභාව ය.
(3) පළමුවන වතිකානු මන්ත්‍රණ සභාව ය. (4) ජෙරුසලම් මන්ත්‍රණ සභාව ය.

12. රෝගීවූවන්ට සැලකීම අපගේ කුමන වගකීමක් ද?

(1) ප්‍රසාද ස්නාපනයේ (2) අභිවෘද්ධි ආලේපනයේ
(3) කිතුණු (4) පූජකවරයේ

13. ජේසුස් වහන්සේගේ මෘත ශරීරය කුරුසියෙන් බා භූමදාන කිරීමට ඉදිරිපත් වූයේ,

(1) ජෝශප් ය. (2) මතේව් ය.
(3) අරමතියේ ජෝශප් ය. (4) අල්පේවුස්ගේ පුත් ජාකෝබ් ය.

14. ශුද්ධාත්මයාණන් ලැබූ ගෝලයන් තුළ ඇති වූ වෙනස්කම් වූයේ,

(1) බය ඇතිවීම හා පසු බැසීම ය. (2) එඩිතර වී දේව වචනයේ සාක්ෂිකරුවන් වීම ය.
(3) සියල්ල පොදුවේ තබා ගැනීම ය. (4) එක්සත්ව එක් සිත්ව යාච්ඤා කිරීම ය.

15. අපෝස්තුළුවරුන් අතරින් ප්‍රථම ප්‍රාණපරිත්‍යාගි වූයේ,

(1) මහා ජාකෝබ්තුමා ය. (2) පේදුරුතුමා ය.
(3) පාවුළුතුමා ය. (4) කුඩා ජාකොබ්තුමා ය.

16. සාවුල්ට (පාවුළුතුමාට) ප්‍රසාද ස්නාපනය දානය කළේ,

(1) අනනියස් ය. (2) නාතාන් ය.
(3) යෙසායා ය. (4) ස්නාවක ජුවාම් ය.

17. "මම පව්කාර මිනිසෙක්මි. මා කෙරෙන් ඉවත් වුව මැනව." මෙය ප්‍රකාශ කළේ,

(1) ශු. පාවුළුතුමා ය. (2) ශු. පේදුරුතුමා ය.
(3) ශු. ජාකොබ්තුමා ය. (4) ශු. අගුස්තීනුතුමා ය.

18. ශුද්ධවූ සභාවේ ලක්ෂණයක් වනුයේ,

(1) සාධාරණත්වය, කතෝලිකත්වය ය. (2) අපෝස්තලිකත්වය හා යුක්තිගරුක බව ය.
(3) සාධාරණත්වය හා ශුද්ධත්වය ය. (4) ශුද්ධත්වය හා යුක්තිගරුක බව ය.

19. ක්‍රි:ව: 1505 දී ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතිකයන් වනුයේ,

(1) ඉංග්‍රීසි ජාතිකයෝ ය. (2) ලන්දේසි ජාතිකයෝ ය.
(3) ඇමරිකානු ජාතිකයෝ ය. (4) පෘතුගීසි ජාතිකයෝ ය.

20. ක්‍රි:ව: 1602 දී ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූතවරු අයත් වනුයේ කුමන නිකායට ද?
(1) දොමිනිකානු නිකායට ය. (2) අගුස්තීනු නිකායට ය.
(3) ඔරතෝරියානු නිකායට ය. (4) ජේසු නිකායට ය.

21. ක්‍රි:ව: 1687 දී ශ්‍රී ලංකා කතෝලිකයන් බේරා ගැනීමට මෙහි පැමිණි පියතුමා වනුයේ,
(1) ජාකොමෙගොන්සාල්වේස් පියතුමා ය. (2) මර්සලින් ජයකොඩි පියතුමා ය.
(3) ජුසේවාස් පියතුමා ය. (4) ජෝශප් රැවැල්ලෝ පියතුමා ය.

22. බ්‍රිතාන්‍ය යුගයේ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකායක් වනුයේ,
(1) අගුස්තීනු නිකාය ය. (2) නිර්මල මරිය නිකාය ය.
(3) ඔරතෝරියානු නිකාය ය. (4) ෆැන්සිස්කාන නිකාය ය.

23. ශ්‍රී ලංකාවේ රදගුරුවසම් කීයක් තිබේ ද?
(1) 12 කි. (2) 11 කි.
(3) 10 කි. (4) 9 කි.

24. දේව ප්‍රසාද නිධානයන්ගේ ප්‍රසාද නිධානය ලෙස හඳුන්වනුයේ,
(1) දිව්‍යසත්ප්‍රසාදය යි. (2) අභිවෘද්ධිආලේපය යි.
(3) ප්‍රසාද ස්නාපනය යි. (4) පූජකවරය යි.

25. සුභාරංචි හතරේ ම ඇති එක ම ප්‍රාතිහාර්ය වනුයේ,
(1) අංශභාග රෝගියා සුව කිරීමේ ප්‍රාතිහාර්ය ය. (2) පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය ය.
(3) කොරවූ මිනිසා සුව කිරීමේ ප්‍රාතිහාර්ය ය. (4) යක්ෂාවේෂ මිනිසා සුව කිරීමේ ප්‍රාතිහාර්ය ය.

26. පූපය මස් වැදැල්ලක් බවට පත් වූ ප්‍රාතිහාර්යය සිදු වූ නගරය වනුයේ,
(1) ජෙරුසලම් නුවර ය. (2) පාදුවා නුවර ය.
(3) ලන්චියානෝ නුවර ය. (4) නර්බෝන නුවර ය.

27. පැරණි ගිවිසුමේ පාස්කු බැටළුවා පාස්කු භෝජනය විය. නව ගිවිසුමේ පාස්කු භෝජනය වනුයේ,
(1) ඊසාක්තුමා ය. (2) ස්නාවක ජුවාම්තුමා ය.
(3) දෙවියන් වහන්සේ ය. (4) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය.

28. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගෝලයන්ගේ පාද සේදීමේදී ජේසුස් වහන්සේ දුන් ආඥාව කුමක් ද?
(1) ඔබ යමක් අනුන් කරනවාට කැමතිද ඔබත් එයම ඔවුනට කරන්න.
(2) ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න.
(3) සතුරන් උදෙසා යාච්ඤා කරන්න
(4) මා ඔබට ප්‍රේමකලාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න.

29. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථය වූයේ,
(1) නික්මයාමේ ගමන සිහි කිරීම ය. (2) කල්වාරි ගමන සිහිකිරීම ය.
(3) පව්වලට වන්දි ගෙවීම සඳහා ය. (4) එතෙරවීම සිහිකිරීම ය.

30. දෙවන ජුවාම් පාවුළු මුනිතුමාගේ මුල් නාමය වූයේ,
(1) රවැල්ලෝ ය. (2) කැරොල් වොයටිල්ලා ය.
(3) කොන්වෙන්පුවල් ය. (4) ජෝශප් මෙනසෙස් ය.

31. බුත්තල ප්‍රදේශයේ දී ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් දිවි පිදූ පියතුමා වනුයේ,

(1) මයිකල් රුද්‍රිගු පියතුමා ය. (2) ශ්‍රී ලාල් පියතුමා ය.

(3) රීඩ් ෂෙල්ටන් පියතුමා ය. (4) පැට්‍රික් පෙරේරා පියතුමා ය.

32. "මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය" මෙම ප්‍රකාශය සඳහන්ව ඇති පොත වනුයේ,

(1) නික්මයාම පොත ය. (2) ද්විතිය නීති සංග්‍රහය පොත ය.

(3) ලෙවී ව්‍යවස්ථාව පොත ය. (4) ගණන් කථාව පොත ය.

33. පළමු පණත ට විරුද්ධව කරන ක්‍රියාවකි.

(1) එදිනෙදා සිදුවීම්වල දී දෙවියන් වහන්සේ ට දොස් කීම.

(2) සෙත් ශාන්ති කර ගැනීම.

(3) යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් නොකිරීම.

(4) දෙවියන් ගැන නොදිවිරීම.

34. ඉරුදින ශුද්ධවත්ව ගත කිරීම සඳහා අප කළ යුතු දෙයකි.

(1) යාළු මිත්‍රයන් සමඟ සතුටුවීම. (2) චිත්‍රපටියක් නැරඹීම.

(3) රෝගීයෙකු බැලීමට යාම. (4) නෑදෑ ගෙදරක යාම.

35. සාමාජීය ප්‍රසාද නිධානයකි.

(1) ප්‍රසාද ස්නාපනය (2) රෝගීන්ගේ ආලේපය

(3) පාපොච්චාරණය (4) පූජාත්වරය

36. දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක වනුයේ,

(1) ශුද්ධ බයිබලය හා සභාවේ ඉගැන්වීම් ය. (2) ශුද්ධ බයිබලය හා දේව ප්‍රසාද නිධාන ය.

(3) ජීවන සම්ප්‍රදාය හා බයිබලය ය. (4) ශුද්ධ බයිබලය හා ජීවන සභා සම්ප්‍රදාය ය.

37. නව ගිවිසුමේ ඉතිහාස පොතකි.

(1) ප්‍රේම ගී පොත (2) තීතස් පොත

(3) ලූක් සුවිශේෂය පොත (4) ගීතාවලිය පොත

38. මැවීමේ පළමු කථාව අයත් සම්ප්‍රදාය වනුයේ,

(1) යාවේ සම්ප්‍රදාය ය. (2) පූජක සම්ප්‍රදාය ය.

(3) එලොයිස්ත සම්ප්‍රදාය ය. (4) ද්විතියික සම්ප්‍රදාය ය.

39. ගෝලයෙකු නොවන අපොස්තුළුවරයා වනුයේ,

(1) ශු. පාවුළුතුමා ය. (2) ශු. ඇම්බ්‍රෝස්තුමා ය.

(3) ස්තේපන්තුමා ය. (4) ශු. ජාකොබ්තුමා ය.

40. මුළු දිවැසිවරු ගණන

(1) 15 කි. (2) 12 කි.

(3) 13 කි. (4) 16 කි.

REFERENCE ONLY

R/C

2016-07-20

මීගමුව අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2016

කතෝලික ධර්මය I , II

විභාග අංකය: ..........................................

| 10 ශ්‍රේණිය | II කොටස |
|---|---|

උපදෙස්

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. i. පැරණි ගිවිසුමේ ඉතිහාස පොත් දෙකක් ලියන්න.

ii. ස්නාවක ජුවාම්තුමාගේ ඉගැන්වීම් දෙකක් ලියන්න.

iii. පාවුළු සංදේශ දෙකක් නම් කරන්න.

iv. භාග්‍ය දෙකක් නම් කරන්න.

v. ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න.

vi. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද දෙකක් ලියන්න.

vii. ජේසුස් වහන්සේ පේදුරුතුමාට පැවරූ වගකීම් දෙකක් ලියන්න.

viii. බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ සේවය සඳහා පැමිණි නිකායන් දෙකක් ලියා දක්වන්න.

ix. පාස්කු භෝජනයේ මූලිකාංග දෙකක් ලියන්න.

x. ජේසුගේ ගෝලයෝ දෙදෙනෙකු නම් කරන්න.

02. i. ශුද්ධ වූ පේදුරුතුමාගේ දේශනයේ කොපමණ ප්‍රමාණයක් කිතුදහම වැළඳ ගත්තේ ද?

ii. උපස්ථායකයින් පත් කිරීමේ දී ඔවුන් තුළ තිබිය යුතු යැයි සොයා බැලූ ගුණාංග 3 ක් ලියන්න.

iii. මුල් කිතුණු සභාවේ සුවිශේෂ ලක්ෂණ 4 ක් ලියන්න.

03. i. පෘතුගීසින් ලංකාවට පැමිණීමට පෙර කිතුදහම ලංකාවේ පැවැති බවට සාක්ෂි දෙකක් ලියන්න.

ii. ලන්දේසි සමයේ කතෝලිකයන්ට එල්ල වූ බාධා 3 ක් ලියන්න.

iii. ජුසේවාස් පියතුමාගේ ජීවිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

04. i. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් ලියන්න.

ii. දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ පූර්ව සලකුණු තුනක් ලියන්න.

iii. දිව්‍ය සත්ප්‍රසාදය ලැබූ ඔබ තුළ ඇති විශේෂ ගුණාංග 5 ක් ලියන්න.

05. i. 6 වන හා 9 වන පණත් නම් කරන්න.

ii. යාච්ඤාවේ ප්‍රධාන අංග තුන ලියන්න.

iii. ඔබට ලැබුණු වරප්‍රසාදවලට තුති පුදා යාච්ඤාවක් ලියන්න.

06. i. පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ පාස්කුවේ සංකේත දෙක ලියන්න.

ii. පාස්කු භෝජනයේ මූලිකාංග 3 ක් ලියන්න.

iii. ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

07. පහත සඳහන් මාතෘකා දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

i. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු පාප්තුමා

ii. භාග්‍යවත් තෙරේසා මව්තුමිය

iii. මයිකල් රුද්‍රිගු පියතුමා

iv. කෝල්බේ මුනිතුමා